# මහායාන බුදුසමය සහ විශ්ලේෂී විධිවේදයේ භාවිතය

**හෝමාගම ධම්මානන්ද හිමි**

මහායාන බුදුසමය සහ විශ්ලේෂී විධිවේදය යන මාතෘකාව යටතේ ලියැවෙන මෙම ලිපිය ආරම්භයේදීම **'මහායාන බුදු සමයත් විශ්ලේෂී විධිවේදයත්'** පිළිබඳ සංක්ෂිප්ත වූ සංකල්පීය විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ලිපියේ අන්තර්ගතය පිළිබඳ දුරවබෝධතා මගහරවා ගැනීමට මහඟු පිටුවහලක් වනු ඇත. එබැවින් පළමුවෙන්ම ඒ කෙරෙහි අවධානය යොමු කරමු. බුදුන් වහන්සේගේ සමස්ත ඉගැන්වීම හෙවත් බුද්ධ වචනය තෙයාකාරයකින් හඳුන්වමු. එනම්,

1. **මුල්බුදු සමය**
2. **ථේරවාදය**
3. **මහායානය,** වශයෙනි.

මුල් බුදුසමය කුමක්ද යන්න පිළිබඳ විද්වතුන් අතර මත කිහිපයක් සාකච්ඡාවට බඳුන් වී තිබේ. කෙනෙකු සඳහන්



කරන්නේ පඨම බෝධිය දක්වා කාලය මුල් බුදුසමය පැවති කාලය බවයි. වෙනත් කෙනෙකු පෙන්වා දෙන්නේ බුද්ධ පරිනිර්වාණය තෙක් පැවති කාලය මුල් බුදුසමය ලෙස සැලකිය යුතු බවයි. තවත් කෙනෙකු සඳහන් කරන්නේ බුද්ධ කාලයත් පරිනිර්වාණයෙන් පසු පවත් වන ලද ප්‍රධාන සංගායනා තුන දක්වා කාලයත් මුල් බුදුසමයට අයත් බවයි. අපගේ පිළිගැනීම වන්නේ බුදුන් ධරමාන කාලය හෙවත් සම්බුද්ධ පරිනිර්වාණය දක්වා වූ කාලය මුල් බුදු සමය පැවති කාලය ලෙස සැලකීම වඩාත් යෝග්‍ය බවයි.

ථේරවාදය යනු කුමක්ද යන්න පිළිබඳව ද විවිධ මත පළකර තිබෙන අතර එයින් වඩාත් යෝග්‍ය මතය වන්නේ බුද්ධ පරිනිර්වානයේ සිට මුල් සංගායනා තුන දක්වා වූ කාලය තුළ සකස් වූ සියල්ල ථේරවාදය ලෙස සැලකිය යුතු බවයි. මහායානය නම් දෙවන සංගායනාවේ සිට වෙන්ව ගිය භික්ෂු සම්ප්‍රදායයන් විසින් සකසාගත් සහ සිව්වන සංගානාවේදී සංග්‍රහ කරන ලද මෙන්ම පසුව විවිධ කොටස්වලට බෙදී ගිය එනම් වජ්‍රයානය, තන්ත්‍රයානය ආදිය ඇතුළත් සමස්තය මෙහිලා සැලකෙන බවයි. මෙම ලිපිය තුළ අපගේ අවධානයට භාජනය වන්නේ යථෝක්ත මහායාන සම්ප්‍රදාය නියෝජනය කෙරෙන මාධ්‍යමික සම්ප්‍රදාය පිළිබඳවය. එය ශූන්‍යතා වාදය ලෙස ද හැඳින්වේ.

මාතෘකාවට අදාළ දෙවන කොටස වන්නේ **'විශ්ලේෂී විධිවේදය'** යන්නයි. විශ්ලේෂී විධිවේදය යනු විශ්ලේෂණය යන්නම ය. එනම් විභජන යයි. බටහිර දර්ශනයේ සමකාලීන අවධිය නියෝජනය කරන නවතම දාර්ශනික සම්ප්‍රදාය ලෙස සැලකෙන්නේ විශ්ලේෂී දර්ශන යයි. බටහිර එන මෙම නවතම දාර්ශනික සම්ප්‍රදායේ භාවිතයත් ඔස්සේ යථෝක්ත මහායාන මාධ්‍යමික සම්ප්‍රදාය විමසීම මෙහි අපගේ මුඛ්‍ය පරමාර්ථ යයි. මෙම කාර්යයේදී අපට පසක් වූයේ මුල් බුදු සමයට හෝ ථේරවාදයට හෝ මහායානයට විශ්ලේෂණ විධිවේදය යන්න අලුත් හෝ ආගන්තුක සංකල්පයක් නොවන බවයි.

බුදු දහම ස්වභාවයෙන් ම විශ්ලේෂණ වාදයකි. බුදු දහමේ සමස්ත උත්සාහය ලෝකය සහ ලෝක සත්වයාගේ යථා ස්වභාවය විවරණය කිරීම වන බැවිනි. එය චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණ සිද්ධාන්තය, කර්මය හා පුනර්භවය ආදී ඕනෑම ඉගැන්වීමක් තුළ මැනවින් ප්‍රදර්ශනය වේ. එබැවින් මේ ඔස්සේ මහායාන බුදුසමයේ එන විශ්ලේෂී විධිවේදයේ භාවිතය කෙසේදැයි විමසා බලමු.

ථේරවාද සම්ප්‍රදායයත් මහායාන සම්ප්‍රදායයත් වෙන් කර හඳුනා ගත හැකි කරුණු, කාරණා, සාධක, බොහෝ ඇත්තා සේම මෙම සම්ප්‍රදායයන් දෙකට ම පොදු වූ සාධක ද ඇති බව පෙන්වාදිය හැකිය. සම්ප්‍රදායයන් දෙකට ම පොදු වූ සාධකත් ඒ ඒ සම්ප්‍රදායට අනන්‍ය වූ සාධකත් යන දෙක



ම මුල් බුදුසමයට අයත් වූ ඒවාය. ඉන් පරිබාහිරව ඒ ඒ සම්ප්‍රදායයන් විසින් අමුතුවෙන් ගොඩනඟන ලද ඒවා හෙවත් ඔවුන්ගේ නවතම නිෂ්පාදන නොවන බවත් සඳහන් කළ යුතුය. ථේරවාදීන්, දෘඪ විනය සහ සම්ප්‍රදාය වාදී වූ අතර මහායානිකයෝ එසේ නොවූහ. මහායානිකයන්ට බුදු දහම අළුතෙන් කියවීමටත්, බෞද්ධ මූලික ඉගැන්වීම් වලට හානියක් නොවන ලෙස විවරණය කිරීමටත් හැකි විය. එසේ කිරීමට ඔවුන්ට හැකි වූයේ යථෝක්ත විශ්ලේෂී විධිවේදය බුදුන් වහන්සේ විසින් මැනවින් භාවිත කර තිබීම නිසාය.

ථේරවාද සම්ප්‍රදාය තුළ ද විද්‍යමාන විශ්ලේෂී දාර්ශනික න්‍යායයේ භාවිතය ථේරවාදීන් විසින් අමුතුවෙන් ඉදිරිපත් කළ එකක් නොව බුදුන් වහන්සේ විසින් ම ඉදිරිපත් කළ උන්වහන්සේගේ භාවිත යයි. මෙම විශ්ලේෂී දාර්ශනික විධිවේදයේ හෙවත් න්‍යායයේ භාවිතයෙහි අර්ථය වූයේ, වඩාත් පැහැදිලි අර්ථ උද්දීපන යයි. තමන්ගේ ධර්ම විනය දෙක, විශ්ලේෂණය මතම, විභජනය මතම ප්‍රකාශ විය යුතු බව බුදුන් වහන්සේ මෙසේ දක්වූහ. 'මහණෙනි, කරුණු තුනක් විවෘත වූයේ මනාව බබලයි. එසේ නොවූයේ නොබබලයි. සඳ හිරු දෙදෙන සහ ධර්ම විනය යනු එම කරුණු තුනයි. සඳ හිරු ආවරණය වූයේ නොබබලයි. විවෘත වූයේ මනාව බබලයි. එසේම තථාගතයන් වහන්සේ විසින් දේසිත ධර්ම විනය දෙක ද විවෘත වූයේ (වඩ වඩාත් විවරණ විශ්ලේෂණ කිරීම) මනාව බබලයි. ආවරණය වූයේ නොබබලයි.[1] යනුවෙනි. මෙහි අවධාරණය කරන්නේ, සඳ හිරු දෙදෙනාගේ බැබලීමට ඒවා වලාකුලින් මැත්වී තිබිය

යුතු බවයි. එය පැහැදිලිය. එසේම තමන්ගේ ධර්ම විනය දෙක ද පද, බ්‍යඤ්ජන වශයෙන් බෙදා වෙන් කොට අර්ථ ගන්වා විභජනය කොට විවරණය කිරීම එහි බැබලීමට මූල සාධක වන බව ද එයින් අවධාරිතයි.

මහායාන සම්ප්‍රදාය බුදුදහම පිළිබඳ අළුත් කියවීමකට මුල පුරන්නේ, මෙබඳු උපදේශ ඔස්සේය. ථේරවාදීන් සම්ප්‍රදායෙන් ඔබ්බට යාමට කිසියම් මැලිකමක් දැක්වූ නමුත් මහායානිකයන් එය කිසියම් අභියෝගයක් ලෙස භාරගත්තේය, එක් පැත්තකින් ථේරවාදය ඇතුළු තම සම්ප්‍රදායට අයත් අනිකුත් ගුරුකුල වලින් එල්ලවූ බලපෑම් සහ අනෙක් පැත්තෙන් හින්දු දර්ශනය ඇතුළු අනිකුත් සම්ප්‍රදායයන්ට මුහුණ දීමේ අවශ්‍යතාව ද පදනම් කරගෙනය. මාධ්‍යමික වැනි බෞද්ධ සම්ප්‍රදායයක් ගොඩනැගෙන්නේ, මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

මහායානයේ මූලික ඉගැන්වීම් ථේරවාදයෙන් පරිබාහිර වූ හෝ ථේරවාදයේ නැති අමුතුම ඉගැන්වීම් නොවේ. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් මුල් බුදු සමයේ නැති දේවල් මහායානයේ ඇතැයි කිව නොහැකිය. මුල් බුදුසමයේ සහ ථේරවාදයේ එන මූලික ඉගැන්වීම් එලෙස ම මහායානයේ ද එයි. එසේ නම් ථේරවාදයත් මහායානයත් අතර පවත්නා වෙනස හෝ පරතරය කුමක්ද? මේ වෙනස අන් කිසිවක් නොව මුල් බුදුසමයේත් ථේරවාදයේත් එන ඉගැන්වීම් අර්ථ කථනය කිරීමේ හෙවත් විවරණය කිරීමේ වෙනස පමණි. එහෙත් එම මහායානික විවරණයන් නාස්තික



වාදී හෝ මුළුමනින් ම මූල දේශනාවලට ප්‍රතිවිරුද්ධ ඒවා නොවන බව කරුණු පරීක්ෂා කිරීමේදී පෙනී යයි.

මුල් බුදුසමයේ මූලික ඉගැන්වීම් ලෙස සැලකෙන්නේ චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණ සිද්ධාන්තය, නිර්වාණය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, අනාත්ම දර්ශනය, කර්මය හා පුනර්භව සිද්ධාන්තය යනාදියයි. ථේරවාදීන් මෙම ඉගැන්වීම් පිළිගනිමින් අනුගමනය කරන අතර මහායානිකයන් ද ඒවා පිළිගෙන තිබේ. මුල් බුදුසමයට අයත් මෙම ඉගැන්වීම් ථේරවාදීන් විසින් කිසියම් ප්‍රමාණයකට විවරණය කර, විශ්ලේෂණය කර අර්ථ කථනය කළ අතර එයින් සෑහීමකට පත් නොවූ මහායාන ආචාර්යවරුන් ස්වකීය සියුම් තාර්කික චින්තනය සහ බුද්ධිය මෙහෙයවා යථෝක්ත ඉගැන්වීම් නවතම ආකාරයකට විශ්ලේෂණය කර තිබේ. මෙම විශ්ලේෂණ නිසා සමහර කරුණු ථේරවාදී විග්‍රහයට වඩා පහසුවෙන් අවබෝධ කර ගැනීමේ හැකියාව උදාවී ඇති අතර සමහර කරුණු ථේවාදී විශ්ලේෂණයට වඩා අතිශය ගැඹුරු සහ සංකීර්ණ බවක් ගෙන තිබෙනු දක්නට ලැබේ.

ධර්මාර්ථ විශ්ලේෂණයේදී මහායානිකයන් සියුම් ලෙස කරුණු විවරණය කර තිබෙන ආකාරය සනාථ කර ගැනීම සඳහා, මහායානිකයන්ගේ විශේෂ අවධානය යොමු වූ ථේරවාදයේ සහ මුල් බුදුසමයේ එන මූලික ඉගැන්වීම් තුනක් පමණක් කෙරෙහි අපගේ අවධානය යොමු කරමු. එනම්, මධ්‍යම ප්‍රතිපදාව, පටිච්චසමුප්පාදය සහ නිර්වාණය යන්නයි.

## මධ්‍යම ප්‍රතිපදාව

ථේරවාද සම්ප්‍රදාය පිළිගන්නා ආකාරයට බුදුන් වහන්සේගේ ප්‍රථම දේශනාව ලෙස සැලකෙන ධම්මචක්කප්පවත්තන සූත්‍රය සහ මහාහත්ථිපදෝපම සූත්‍රය මෙන්ම සච්චවිභංග ආදී අනෙකුත් සූත්‍රයන්හි මධ්‍යම ප්‍රතිපදාව විවරණය කර තිබෙන්නේ, කාම සුඛල්ලිකානුයෝගය සහ අත්ත කිලමථානුයෝගය යන, එකල ආගමික සහ දාර්ශනික ලෝකය විසින් විමුක්ති ප්‍රතිලාභය පිණිස ඒකායන මාර්ග ලෙස පිළිගෙන පැවති අන්තවාදී ප්‍රතිපදාවන් ප්‍රතික්ෂේප කොට ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම මධ්‍යම ප්‍රතිපදාව වශයෙනි. එයම බෞද්ධ විමුක්තිගාමී ප්‍රතිපදාව ලෙස ද එහි අවධාරිතය.[2] නූතනයේ සමහර විද්වතුන් අදහස් කරන්නේ 'මධ්‍යම ප්‍රතිපදාව' යනු යථෝක්ත අන්තගාමී බවින් තොර 'මැද පිළිවෙත' යන්න නොව විමුක්තිය සඳහා 'ප්‍රධාන පිළිවෙත' යන අර්ථය එයින් ගම්‍ය වන බවයි.

මෙහි තිබෙන ගැටළුව නම් යමක් ප්‍රධාන යැයි කීවිට අප්‍රධාන හෝ අවශේෂ මාර්ගයක් ද ඇතැයි ඉන් ගම්‍ය වීමයි. විමුක්ති ප්‍රතිලාභය සඳහා ප්‍රධාන, අප්‍රධාන වශයෙන් ප්‍රතිපදා හෝ මාර්ග තිබිය නොහැකිය. ප්‍රතිපදාව හෝ මාර්ගය නම් එකක් ම විය යුතුය. අනෙක් අතට මෙම අර්ථකථනයට මොවුන් පැමිණ තිබෙන්නේ 'මධ්‍යම' යන වචනය හුදකලාව ගෙනය.



'මධ්‍යම' යන වචනයට භාෂාවේ විවිධ අර්ථ ඇති බව අපි දනිමු. **'ද්වේ මේ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා'** යන සූත්‍ර පාඨය අයත් සන්දර්භයෙන් පිටතට ගෙන 'මජ්ඣිමා පටිපදා' යන්න අර්ථ කථනය කිරීම සැබවින්ම වෙනත් අර්ථ උද්දීපනයට හේතු වේ. එබැවින් එය එම සන්දර්භයේම අනිකුත් අර්ථ හා සසඳා විවරණය කිරීම මිස ඉන් පිටතට ගෙන විවරණ සැපයීම නොසුදුසු බව අවධාරණය කළ යුතුය. කෙසේ නමුත් මෙය තවදුරටත් විමසා බැලිය යුතු කරුණක් බව සඳහන් කළ යුතුය.

ථේරවාද විවරණයට අනුව 'මධ්‍යම ප්‍රතිපදාව' යන්න ඉහත දක්වූ පරිදි විශ්ලේෂණය කෙරී ඇති නමුත් මහායානිකයන්ගේ විශ්ලේෂණය මීට වඩා වෙනස් බවක් ගෙන තිබේ. මහායාන සම්ප්‍රදායෙහි අග්‍රඵලය ලෙස විද්වත් ලෝකයා අවිවාදයෙන් පිළිගනු ලබන මාධ්‍යමික සම්ප්‍රදාය එනමින් හඳුන් වන්නේ ද 'මධ්‍යම ප්‍රතිපදාව' යන්න නවතම ආකාරයකට අර්ථ ගැන්වීම නිසාය. නාගාර්ජුන පාදයන්ට අනුව මධ්‍යම ප්‍රතිපදාව යනු ශාස්වත, උච්ඡේද වාද දෙකට නොගොස්, ශාස්වත, උච්ඡේද සංඛ්‍යාත අන්තද්වයට නොපැමිණ යථාස්වක (තමාට යෝග්‍ය පරිදි වූ) ප්‍රත්‍යයෙන් අනුරූප ඵලෝත්පත්තිය පිළිගැනීම 'මධ්‍යම ප්‍රතිපදාව' බවයි. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් 'යමක් ප්‍රතීත්‍ය සමුප්පාද වේනම් එයින් ශූන්‍යතාව ප්‍රකාශ කෙරේ. ඒ ශූන්‍යතා ප්‍රඥප්තිය නිසා ඕතොමෝ මධ්‍යම ප්‍රතිපදාව වන්නේය'යනුයි. [3] දාර්ශනික වශයෙන් පැවති සියලු අන්තගාමී ප්‍රතිපදාවන් බැහැර කළ නිසා මාධ්‍යමිකයන්

එනමින් හඳුන් වන බවත් ශාස්වත, උච්ඡේද වාද විශේෂයන් නොපිළිගන්නා මොවුන් තාර්කික චින්තනයෙන් පරතෙරට ගිය පෙරදිග බිහි වූ අග්‍රගන්‍ය දාර්ශනික ගුරුකුලය බවත් ඉතා පැහැදිලිය[4]

මධ්‍යම ප්‍රතිපදාව පිළිබඳ මාධ්‍යමිකයන්ගේ නව අර්ථකථනය වූයේ 'මධ්‍යම ප්‍රතිපදාව නම් ශූන්‍යතාවයයි' යන්නයි. මධ්‍යම ප්‍රතිපදාව පිළිබඳ මෙවැනි අර්ථකථනයක් ථේරවාදයේ හෝ වෙනත් බෞද්ධ සම්ප්‍රදායක දක්නට නොලැබේ. ශූන්‍යතා වාදය පිළිබඳ ඉතාම නිරවුල් සහ පැහැදිලි විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබෙන්නේ, ආචාර්ය නාගාර්ජුන පාදයන් විසින් විරචිත මූලමාධ්‍යමික කාරිකාව තුළය. එහෙත් ශූන්‍යතා වාදයේ නිර්මාතෘ නාගාර්ජුන පාදයන් නොවන බව මහායාන සම්ප්‍රදායට අයත් සාහිත්‍ය පරීක්ෂා කිරීමේදී පැහැදිලිව පෙනී යයි. මේ පිළිබඳ පුළුල් අධ්‍යයනයන් කළ විද්වතුන් පෙන්වා දෙන ආකාරයට මහායාන ශ්‍රද්ධොත්පාද ශාස්ත්‍රයෙහි සහ ප්‍රඥාපාරමිතා සූත්‍රවලත් ශූන්‍යතා වාදයෙහි මූල බීජ දක්නට ලැබේ. එපමණක් නොව නාගාර්ජුන පාදයන් විසින් මැනවින් සංවර්ධනය කොට ඉදිරිපත් කරන ලද ශූන්‍යතාවාදී සංකල්පය තවදුරටත් විවරණය කිරීමට ආර්යදේව සහ චන්ද්‍රකීර්ති යන ආචාර්යවරුන් ද පුරෝගාමී වී තිබෙන බව ද පෙන්වා දිය හැකිය[5]



'මධ්‍යම ප්‍රතිපදාව නම් ශූන්‍යතාවය'ය යන ප්‍රස්තුතයෙන් කියැවෙන්නේ කුමක්ද යන්න විමසීමට පෙර 'ශූන්‍ය' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න විමසිය යුතුය. ශූන්‍ය යන්නෙහි මූලික අර්ථය හිස් බව, කිසිවක් නැති බව[6] යන්නයි. එහෙත් මෙහි අප සාකච්ඡා කරන ශූන්‍යතා දර්ශනය යන්නෙන් අදහස් කරන්නේ මේ සරල අර්ථය නොවේ. කෝෂ ග්‍රන්ථවල 'ශූන්‍යතා දර්ශනය' යන්න අර්ථ ගන්වා තිබෙන්නේ ශාස්වත, උච්ඡේද වාද දෙකට හෝ අස්ති, නාස්ති දෙකට හෝ නොගොස් (නොවැටී) මධ්‍යම ප්‍රතිපදාව පිළිගැනීමේ දර්ශනය ශූන්‍යතා දර්ශනය බවයි.[7] මෙහි සඳහන් වන්නේ ද මාධ්‍යමික දර්ශනය ගැනයි.

ඉහත දැක්වූ පරිදි 'මධ්‍යම ප්‍රතිපදාව නම් ශූන්‍යතාව යැයි' යන්න නාගාර්ජුන පාදයන් ප්‍රකාශ කරන්නේ කුමන අර්ථයෙන්දැයි විමසා බලමු. 'මධ්‍යම ප්‍රතිපදාව ශූන්‍යතාව යැයි' ප්‍රකාශ කරන විට එකවරම අපට ඇති වන ගැටළුව වන්නේ එසේ නම් 'ශූන්‍යතාව' යනු කුමක්ද යන්නයි. ඉහත ද සඳහන් කළ පරිදි ශූන්‍යතාව යන්නෙන් නාගාර්ජුන පාදයන් අදහස් කරන්නේ සාමාන්‍ය ව්‍යවහාරයේ තිබෙන ශූන්‍යතා අර්ථය නොවේ. සාමාන්‍ය ව්‍යවහාරය පිළිගත හොත් අප මහත් අවුලකට පත්වේ. මෙහි ශූන්‍යතා යන්නෙන් නාගාර්ජුන අදහස් කර තිබෙන්නේ පටිච්චසමුප්පාදය යන්නයි. ඒ බව පැහැදිලිව ම කාරිකාවේ මෙසේ සටහන් කර තිබේ. 'යමක් ප්‍රතීත්‍යසමුප්පාද වේද ඒ ශූන්‍යතාව කියමු. ඒ ශූන්‍යතා ප්‍රඥප්තිය නිසා ඕතොමෝ මධ්‍යම ප්‍රතිපදාව වන්නීය'යනුයි.[8]

මෙයින් ශූන්‍යතාව යනු ප්‍රතීත්‍යසමුප්පාදයය යන්න පමණක් නොව එයම මධ්‍යම ප්‍රතිපදාව බව ද අවධාරණය කරයි. එනම් මධ්‍යම ප්‍රතිපදාවත්, පටිච්චසමුප්පාදයත්, ශූන්‍යතාවත් යනු එකක්ම බව කීමයි. අනෙක් අතට ප්‍රතීත්‍යසමුප්පාද නොවූ හෙවත් ශූන්‍යතාවට යටත් නොවූ කිසිදු ධර්මයක් අවිද්‍යමාන බව ද නාගාර්ජුන පෙන්වා දේ. 'හේතුප්‍රත්‍ය සමුප්පන්නව හටනොගත් කිසි ධර්මයක් නොවේද? එහෙයින් ශූන්‍ය නොවූ කිසි ධර්මයක් ද විද්‍යමාන නොවේ[9] යනුවෙන් කාරිකාවෙහි එය දක්වා තිබේ.

## පටිච්චසමුප්පාදය

මධ්‍යම ප්‍රතිපදාවත්, පටිච්චසමුප්පාදයත්, ශූන්‍යතාවත් එකක්මය යනුවෙන් නාගාර්ජුන පාදයන් ඉදිරිපත් කරන අර්ථකථනය තවදුරටත් පැහැදිලි කර ගැනීම අවශ්‍යය. මෙහි ඉතා පැහැදිලි කරුණ නම් ථේරවාද සම්ප්‍රදාය තුළ හෝ වෙනත් බෞද්ධ සම්ප්‍රදායක ඉදිරිපත් කරන අර්ථය ඉක්මවාගිය ගැඹුරු, සියුම් අර්ථයක් නාගාර්ජුන අදහස් කළ බවයි. මෙහි කේන්ද්‍රීය විෂය වන්නේ පටිච්චසමුප්පාදය යි. එහෙත් මෙම පටිච්චසමුප්පාද විශ්ලේෂණය ඉදිරිපත් කරන්නේ ථේරවාදය ඇතුළු අනෙකුත් සම්ප්‍රදායයන්ගේ විශ්ලේෂණය ඉක්මවා ගිය අන්‍යෝන්‍ය සාපේක්ෂක අර්ථයෙනි. දැනගත යුතු එකම දෙය පටිච්චසමුප්පාදය බවත් එයම ශූන්‍යතාව බවත් කාරිකාවේ විසිහතර වන පරිච්ඡේදය පුරාම අවධාරණය කර තිබේ. පටිච්චසමුප්පාද මූලධර්මය මත



ඉදිරිපත් කෙරෙන ශූන්‍යතාව අප විසින් දැනගත යුතු එකම දෙයයි. ශූන්‍යතාව නම් භෞතික ශූන්‍යතාවක් නොවේ. ශූන්‍යතාව අවධාරණය කිරීමේ ඒකායන අරමුණ සියලු දෘෂ්ටි ප්‍රහාන යයි.[10] පුද්ගලයා, සත්ත්වයා සසරට බැඳ තබන එකම සහ ප්‍රධානතම බන්ධනය විවිධ දෘෂ්ටි ගැනීමයි. දෘෂ්ටි ප්‍රහානය අරමුණු කොට ඉදිරිපත් කළ ශූන්‍යතාව තවත් දෘෂ්ටියක් ලෙස නොගත යුතු බව ද නාගාර්ජුන අවධාරණය කරයි. එහෙත් යමෙක් ශූන්‍යතාව දෘෂ්ටියක් ලෙස ගනී නම් ඔහු සුව කළ නොහැකි රෝගියෙකු වැනි බව ද නාගාර්ජුන පෙන්වා දේ.[11]

මහායාන පටිච්චසමුප්පාද විවරණය අන්‍යෝන්‍ය සාපේක්ෂකාර්ථයෙන් දක්වා ඇති බව යට සඳහන් කරන ලදී. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් එයින් කියවෙන්නේ සියල්ල පටිච්චසමුප්පන්න බවත් ඒ නිසා අන්‍යෝන්‍ය සාපේක්ෂක බවත් නිරපේක්ෂක කිසිවක් නැති බවත්ය. බුදුදහමේ එන වැදගත් ම ඉගැන්වීමත් පටිච්චසමුප්පාදය බව ද මහායානිකයෝ මේ තුළින් අවධාරණය කරති. මෙම අදහස ථේරවාදයේ ද එසේම පිළිගනී. මහාහත්ථිපදෝපම සූත්‍රයේ සඳහන් වන ආකාරයට යමෙක් පටිච්චසමුප්පාදය දකී නම් ඔහු ධර්මය දකින බවත් යමෙක් ධර්මය දකී නම් ඔහු පටිච්චසමුප්පාදය දකින බවත් සඳහන් කිරීම තුළින් ප්‍රකාශ වන්නේ එයයි.[12] සියල්ල පටිච්චසමුප්පන්නය යන මහායානික විශ්ලේෂණයට මූල සාධක වන්නේ යථොක්ත සූත්‍රයෙහි එන 'පටිච්චසමුප්පන්නා

බෝ පනිමේ යදිදං පඤ්චුපාදානක්ඛන්ධා' යන්නයි. මෙයින් කියවෙන්නේ උපාදානස්කන්ධ පඤ්චකය ප්‍රත්‍යයෙන් උපන් බවයි. පඤ්චස්කන්ධය පටිච්චසමුප්පන්න යැයි කීමෙහි අර්ථය සියල්ල පටිච්චසමුප්පන්න යැයි කීමය. පරමාර්ථමය වශයෙන් ගත් විට පඤ්චස්කන්ධයෙන් වියුක්ත වූ ලෝකයක් ගැන බුදුදහම කථා නොකරන නිසා සියල්ල යනු පඤ්චස්කන්ධය යැයි කීමෙහි වරදක් නැත. ඒ අනුව පටිච්චසමුප්පන්න වූ සියල්ල ලෙස ගැනෙන පඤ්චස්කන්ධය විශ්ලේෂණය කළ විට ගත හැකි කිසිවක් (ස්ථිරසාර) නොමැති බැවින් සියල්ල ශූන්‍ය යැයි කීම සාධාරණය.

මෙසේ ශාස්වත, උච්ඡේද වශයෙන් අන්තගාමී ප්‍රතිපදාවකට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටීමත් මධ්‍යම ප්‍රතිපදාව නම් පටිච්චසමුප්පාදය යැයි කීමත්, පටිච්චසමුප්පන්න බව යන්නෙන් අදහස් කෙරෙන්නේ ශූන්‍යතාවය යැයි කීමත් සැබවින් ම සංස්ථිතිකය. මෙම විශ්ලේෂණ අවබෝධ කරගත යුත්තේ සම්මුති, පරමාර්ථ භේදය මත සිටය. ථේරවාදය සහ මුල් බුදුසමය තුළ කථා කෙරෙන සම්මුති, පරමාර්ථ ප්‍රභේදය මහායානිකයන් ද තම විශ්ලේෂණයන් සඳහා මැනවින් භාවිත කර තිබේ.

මහායානිකයන් විසින් පටිච්චසමුප්පාදය පදනම් කොට විශ්ලේෂණය කෙරෙන ශූන්‍යතාව නම් අන් කවරක්වත් නොව පරමාර්ථ ධර්ම විශ්ලේෂණයකි. බුදුන් වහන්සේ සම්මුති පරමාර්ථ වශයෙන් දෙයාකාර සත්‍යයක් ඉදිරිපත් කළ බවත් මෙම උභය සත්‍යය නොවැටහේ නම් ගැඹුරු වූ බුද්ධ



දේශනය අවබෝධ නොවන බවත් ව්‍යවහාර මාත්‍රය තුළින් පරමාර්ථය දේශනා කර ඇති බවත් පරමාර්ථයට නොපැමිණ නිර්වාණාධිගමයක් කිසිසේත් නොවන බවත් කාරිකාවෙහි පැහැදිලිව දක්වා ඇත[13]

## නිර්වාණය

මාධ්‍යමික ප්‍රතිපදාවත්, පටිච්චසමුප්පාදයත් යන මූලික ඉගැන්වීම් දෙක මහායානය තුළ, විශේෂයෙන් මාධ්‍යමික දර්ශනය තුළ කෙසේ විශ්ලේෂණය කෙරී ඇත්දැයි සංක්ෂිප්තව ඉහතින් දක්වන ලදී. මීළඟට අප අවධානය යොමු කරන්නේ නිර්වාණ සංකල්පය පිළිබඳ මහායානික විශ්ලේෂණය කෙසේද යන්න විමසීමටය. මහායානය කෙරෙහි ථේරවාදය ඇතුළු අනිකුත් බෞද්ධ සම්ප්‍රදායයන් තුළ දැඩි විරෝධාකල්ප ගොඩනැගීමට මූලික හේතුව වූයේ මහායානිකයන් මුල් බුදුසමයේ එන දේශනා පිළිබඳ ඉදිරිපත් කරන ලද නව අර්ථකථනයන් බව මීට ඉහතින් ද පෙන්වා දෙන ලදී. අනිකුත් මූලික ඉගැන්වීම් සේම නිර්වාණය පිළිබඳ විවරණය ද නවතම ආකාරයකට මහායානිකයන් ඉදිරිපත් කර තිබේ.

මුල් බුදුසමය තුළ නිර්වාණය යන්න විග්‍රහ කර තිබෙන්නේ සංසාරයෙන් වෙන් වීම, සසර ගමන නැවැත්වීම, තෘෂ්ණාව නැති බව, කෙලෙසුන්ගෙන් මිදීම ආදී වශයෙනි. ඉතාම සරලව සඳහන් කරන්නේ නම් සසරට ප්‍රතිවිරුද්ධ

දෙය නිවනයි. එහෙත් නාගාර්ජුන පාදයන් ප්‍රකාශ කරන්නේ සංසාරය සහ නිර්වාණය දෙකක් නොව එකක් බවයි. සසර සහ නිවන අතර ඇත්තේ දෘෂ්ටිකෝණමය වෙනසක් හෙවත් බලන ආකාර දෙකක් මිස වෙන කිසිවක් නොවන බව නාගාර්ජුනගේ විශ්ලේෂණයයි.[14] මෙම අදහස තීව්‍ර කරමින් කාරිකාව සඳහන් කරන්නේ නිර්වාණයාගේ කෙළවර සහ සංසාරයේ කෙළවර අතරත් ඉතා සියුම් අන්තරයක් විද්‍යමාන නොවන බවයි.[15] මෙයින් පෙනී යන්නේ මහායානික විශ්ලේෂණයන් තාර්කික බවින් පරතෙරට ගොස් ඇති බවත් එම විශ්ලේෂණයන් අභිබවා ගොස් තවදුරටත් කළ හැකි විශ්ලේෂණයක් එහි ඉතිරිව නැති බවත්ය.

මෙම කරුණු සමාලෝචනය කිරීමේදී අපට බැස ගත හැකි නිගමනය වන්නේ මහායාන සම්ප්‍රදායයෙහි විශිෂ්ටතම ගුරුකුලය වන මාධ්‍යමික දර්ශනය තරම් බුදුදහමේ එන මූලික ඉගැන්වීම් සම්බන්ධයෙන් සියුම් සහ තාර්කික විශ්ලේෂණයක් මුල් බුදුසමයේ හෝ ථේරවාදය ඇතුළු අනිකුත් සම්ප්‍රදායයන්හි දක්නට නොලැබෙන බවයි. එසේම මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුතු කරුණක් වන්නේ සාම්ප්‍රදායික බවින් ඔබ්බට නොගොස් එහිම සිරවී සිටි ථේරවාදීන්ට හෝ අනිකුත් සම්ප්‍රදායයනට වඩා මුල් බුදුසමයේ දාර්ශනික අංශය මැනවින් ප්‍රකට කිරීමටත් මනාව එය ඉහලට ඔසවා තැබීමටත් මහායානිකයන් ප්‍රශංසනීය උත්සාහයක නිරතවී ඇති බවයි.



## ආන්තික සටහන්

1. තීණිමානි භික්ඛවේ විවටානි විරෝචන්ති. නොපටිච්ඡන්නානි. කතමානි තීණි. චන්දමණ්ඩලං භික්ඛවේ විවිටං විරෝචති. නොපටිච්ඡන්නං. සූරිය මණ්ඩලං භික්ඛවේ විවිටං විරෝචති. නොපටිච්ඡන්නං. තථාගතප්පවේදිතෝ ධම්ම විනයෝ භික්ඛවේ විවටෝ විරෝචති. නොපටිච්ඡන්නෝ. ඉමානි ඛෝ භික්ඛවේ තීණි විවටානි විරෝචන්ති. නොපටිච්ඡන්නානීති.. අ. නි. 1, තිකනිපාතය, බු. ජ. ත්‍රි 510 පිට.

2. ද්වේ මේ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යෝ චායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථ සංහිතෝ. යෝ චායං අත්ථකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ. එතේ තේ භික්ඛවේ උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛු කරණී, ඤාණකරණී, උපසමාය, අභිඤ්ඤාය සම්බෝධාය, නිබ්බානාය සංවත්තති. කතමාචසා භික්ඛවේ මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා......අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ... සං. නි. 5 (2), බු.ජ.ත්‍රි. 270 පිට

3. යඃ ප්‍රතීත්‍ය සමුප්පාදඃ ශූන්‍යතාං තාං ප්‍රවක්ෂ්මහේ සා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත් සෙව මාධ්‍යමා. සාසනරතන හිමි මොරටුවේ, මූලමාධ්‍යමික කාරිකාව, 1963, 160 පිට.

4. මේධානන්ද හිමි දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය, හැඳින්වීමක්, 51 පිට.

5. පඤ්ඤාසේන හිමි ගාල්ලේ, 'ශූන්‍යතාවාදය' විදුලකර, ප්‍රඥාසාර ප්‍රසස්ති, බඹරැන්දේ සිරිසීවලී හිමි, සංස්. 1966, 309 පිට.

6. විජේතුංග හරිස්චන්ද්‍ර, ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, 1702 පිට.

7. එම,

8. යඃ ප්‍රතීත්‍ය සමුප්පාදඃ ශූන්‍යතාං තාං ප්‍රවක්ෂ්මහේ සා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත් සෙව මාධ්‍යමා. සාසනරතන හිමි මොරටුවේ, මූලමාධ්‍යමික කාරිකාව, එම, 1963, 160 පිට.

9. අප්‍රතීත්‍ය සමුත්පන්නෝ ධර්මඃ කශ්චින්න විද්‍යතේ යස්මාත්තස්මාද ශූන්‍යෝහි ධර්මඃ කශ්චින්න විද්‍යතේ. එම, 160 පිට

10. සර්ව දෘෂ්ටි ප්‍රහාණාය යඃ සද්ධර්මමදේශයත් අනුකම්පාමුපාදාය තං නමස්‍යාමි ගෞතමම්. එම, 171 පිට

11. ශූන්‍යතා සර්ව දෘෂ්ටීනාං ප්‍රොක්තා නිශ්ශරණං ජිනෛඃ යේශාංතු ශූන්‍යතා දෘෂ්ටිඃ තානසාධ්‍යාන් බභාපිරේ. එම, 134 පිට

12. එවං කිර මේසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සංගහෝ සන්නිපාතෝ සමවායෝ හෝති. වුත්තං හේතං පනේතං භගවතා. යෝ පටිච්චසමුප්පාදං පස්සති. සෝ ධම්මං පස්සති. යෝ ධම්මං පස්සති සෝ පටිච්චසමුප්පාදං පස්සති. පටිච්චසමුප්පාන්නා බෝ පනිමේ යදිදං පඤ්චුපාදානක්ඛන්ධා. ම. නි. 1, මහාහත්ථිපදෝපම සූත්‍රය, බු.ජ.ත්‍රි. 462 පිට.

13. ද්වේසත්‍යෙ සමුපාශ්‍රිත්‍ය බුද්ධානං ධර්මදේශනා
ලෝකසම්මුති සත්‍යංච සත්‍යංච පරමාර්ථතඃ
යේන යෝර්න විජානන්ති විභාගං සත්‍යයෝර් ද්වයෝඃ
තේ තත්ත්වං නවිජානන්ති ගම්භීරං බුද්ධශාසනේ
ව්‍යවහාර මනාශ්‍රිත්‍ය පරමාර්ථෝ නදේශ්‍යතේ.
පරමාර්ථ මනාගම්‍ය නිර්වාණං නාධිගම්‍යතේ. මූලමාධ්‍යමික කාරිකාව, එම, 159 පිට.

14. න සංසාරස්‍ය නිර්වාණාත් කිඤ්චිදස්ති විශේෂණං න නිර්වාණස්‍ය සංසාරාත් කිඤ්චිදස්ති විශේෂණං. මූලමාධ්‍යමික කාරිකාව, එම, 164 පිට.

15. නිර්වාණස්‍ය ච යා කෝටිඃ කෝටිඃ සංසාරණස්‍යච නතයෝරන්තරං කිඤ්චිත් සුසූක්ෂ්මමපි විද්‍යතේ. මූලමාධ්‍යමික කාරිකාව, එම, 165 පිට.